<u>මොනරාගල ප්‍රාදේශීය සභාව</u>

## 2022.03.11 දින මහ සභා වාර්තාව

මොනරාගල ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයේ නිළ කාලය ආරම්භ කිරීමෙන් පසුව පවත්වනු ලැබූ හතලිස් අට වන (48) සභා වාරය 2022.03.11 වන දින ප.ව 02.30 ට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එහි සංෂිප්ත වාර්තාව පහත සඳහන් කරමි.

**<u>පැමිණීම</u>**

| | | |
|---|---|---|
| 01. ගරු සභාපති | - | ආර්.එම්.රත්නවීර මැතිතුමා |
| 02. ගරු උප සභාපති | - | ආර්.එම්.ප්‍රදීප් විජේරත්න මැතිතුමා |
| 03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩී.සුනිල් අරංගල මැතිතුමා |
| 04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.ක්‍රිශාන්ත රත්නායක මැතිතුමා |
| 05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජී.ඩී.චාමර නානායක්කාර මැතිතුමා |
| 06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එම්.ගුණවර්ධන මැතිතුමා |
| 07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | රංජිත් රත්නායක මැතිතුමා |
| 08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තරංග දිසානායක මැතිතුමා |
| 09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තමෝදිරම් ජයජීලන් මැතිතුමා |
| 10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සන්ධ්‍යා අනුරුද්ධිකා රත්නායක මැතිතුමිය |
| 11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.අතුලකුමාරසිරිමැතිතුම (ප්‍රතිපක්ෂනායක) |
| 12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ප්‍රදීප් ධම්මික විතානගේ මැතිතුමා |
| 13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.රමණී රත්නායක මැතිතුමිය |
| 14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.උදේනි රම්‍යලතා මැතිතුමිය |
| 15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.මනෝජා ලක්මිණී මැතිතුමිය |
| 16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.සනත් ගුණවර්ධන මැතිතුමා |
| 17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.එම්.පී.බණ්ඩාර මැතිතුමා |
| 18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | අජිත් ශාන්ත අගලකඩ මැතිතුමා |
| | | |
| සභා ලේකම් | - | ඩී.එම්.අනුර දිසානායක මහතා |

**<u>නොපැමිණීම</u>**

| | | |
|---|---|---|
| 01.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | වයි.උපුල් මැතිතුමා |

**<u>පිළිගැනීම</u>**

පළමුව ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් මාසික මහ සභාව සාර්ථක කර ගැනීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා, සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටින සියලු දෙනා පිළි ගනිමින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## 01. <u>පසුගිය මස සභා වාර්තාව සභා සම්මත කර ගැනීම</u>.

මේ වන විටත් ඔබතුමන්ලාහට ලබා දී ඇති පසුගිය මාසික මහ සභාවේ සභා වාර්තා කෙටුම්පත කියවූවා සේ සලකා සංශෝධන ඇත්නම් ඒවා පෙන්වා දී සංශෝධන නැත්නම් ගරු සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

එහිදී සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පසු ගිය මස මහ සභා වාර්තාව සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමන්ගේ සහ කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමන්ගේ යෝජනා ස්ථීරත්වයෙන් මහ සභාවේ ඒකමතික එකඟතාවයෙන් සභා සම්මත කරන ලදි.

## 02 සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

නැත

## 03 සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව වෙත ඉදිරිපත් කිරීම.

නැත

## 04 යථා පරිදී කල් දී ඇති ප්‍රශ්න සාකච්ඡා කිරීම

නැත

## 05. යථා පරිදී කල් දී ඇති යෝජනා සාකච්ඡා කිරීම

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීම හා සභා තීරණ ගැනීම බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

## 05.1 ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

### යෝජනා අංක 01

මොණරාගල ප්‍රාදේශිය සභාවට අයත් නව බස්නැවතුම්පොල භූමියේ කඩ සංකීර්ණයේ අලුතින් ඉදිකර ඇති කඩ කාමර හතරෙහි මාසික කුලිය රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර පහත සඳහන් පරිදි අප වෙත ලබා දී ඇත ඒ අනුව මෙම කඩ කාමර හතරට අදාළ ප්‍රධාන මුදල කොපමණද යන්න තීරණය කර ඒ සඳහා මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

| අනු අංකය | කඩ කාමර අංකය | මාසික වෙළඳපල කුලිය |
|---|---|---|
| 01 | 01 | රු.21,500.00 (රුපියල් විසි එක්දහස් පන්සියය)යි |
| 02 | 02 | රු.21,500.00 (රුපියල් විසි එක්දහස් පන්සියය)යි |
| 03 | 03 | රු.21,500.00 (රුපියල් විසි එක්දහස් පන්සියය)යි |
| 04 | 04 | රු.21,500.00 (රුපියල් විසි එක්දහස් පන්සියය)යි |

එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

ඒ වගේම මේ සඳහා ටෙන්ඩර් කොන්දේසි ඉදිරිපත් කිරීමේදී ටෙන්ඩරය පිරිනැමූ බදු කරුවන් විසින් කඩ කාමර සඳහා ඉදිරිපත් කරන ලද ලංසු මුදල අදාල ටෙන්ඩරය ලබා ගත් දින සිට දින 07 ක් ඇතුළත ගෙවා අවසන් කිරීමෙන් පසු බදු කරු සමඟ ගිවිසුම් ගත විය යුතු බවත්, එසේ දින 07 ක් ඇතුළත අදාල බදු කරු විසින් ප්‍රධාන මුදල් ගෙවා අවසන් කිරීමට අපොහොසත් වන්නේනම් එම ටෙන්ඩරය දෙවෙනියට වැඩිම ලංසු මුදල ඉදිරිපත් කර ඇති අය වෙත අදාල ටෙන්ඩරය පිරි නැමීමට කටයුතු කිරීම සුදුසු බවට කොන්දේසියක් මෙම දේපළ බදු දීමේදී අදාල ටෙන්ඩර් කොන්දේසි වලට අනිවාර්යයෙන්ම ඇතුළත් කර ගත යුතු බවත් ඒ වගේම මෙම දේපළ බදු දීම සඳහා ටෙන්ඩර් මණ්ඩලයක්ද පත් කර ගත යුතු බැවින් මේ අවස්ථාවේදීම එම ටෙන්ඩර් මණ්ඩලයද පත් කර ගන්නා ලෙසත් ගරු  සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව  සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින් ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙසේ මාසිකව තක්සේරු කර ඇති මුදලට සාපේක්ෂව හා නගරයේ බදු දී ඇති අනිකුත් කඩ කාමර බදු දී ඇති ප්‍රධාන මුදල් ද පදනම් කර ගනිමින් මෙම නව කඩ කාමර 04 සඳහා එක් කඩ කාමරයක් රුපියල් ලක්ෂ 05 බැගින් වූ ප්‍රධාන මුදලකට (කී මනී) , අදාල විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව එම මුදල ලංසු මුදල ලෙස සලකා ටෙන්ඩර් කර බදු දීම සුදුසු බවත්, ඒ වගේම එම නව කඩ කාමර සඳහා අදාල බදුකරුවන් සමග ගිවිසුම්ගත වීමේදී තිස් අවුරුද්දක් සඳහා කොන්දේසි සහිතව ගිවිසුම්ගතවීම සුදුසු අතර, එය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත් කිරිමෙන් අනතුරුව ඒ අනුව ඉදිරි කටයුතු කිරිම සුදුසු බවටත්  මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

එසේම මේ සඳහා ටෙන්ඩර් කොන්දේසි ඉදිරිපත් කිරීමේදී බදු කරුවන් විසින් කඩ කාමර සඳහා ඉදිරිපත් කරන ලද ලංසු මුදල අදාල ටෙන්ඩරය ලබා ගත් දින සිට දින 07 ක් ඇතුළත ගෙවා අවසන් කිරීමෙන් පසු බදු කරු සමඟ ගිවිසුම් ගත විය යුතු බවත්, එසේ දින 07 ක් ඇතුළත අදාල බදු කරු විසින් ප්‍රධාන මුදල් ගෙවා අවසන් කිරීමට අපොහොසත් වන්නේනම් එම ටෙන්ඩරය දෙවෙනියට වැඩිම ලංසුව ඉදිරිපත් කර ඇති අය වෙත අදාල ටෙන්ඩරය පිරි නැමීමට කටයුතු කිරීමට පියවර ගැනීම සුදුසු බවත්, ඒ සඳහා  ටෙන්ඩර් කොන්දේසියක් පැනවීම සුදුසු බවටත් එසේම මෙම දේපල ටෙන්ඩර් කිරීම සඳහා නව ටෙන්ඩර් කමිටුවක් පත් කිරීම අවශ්‍ය නොවන බැවින් 2022 වර්ෂයේ සභාව සතු දේපළ බදු දීම වෙනුවෙන් 2021.10.15 වන දින මහ සභාවේදී පත් කරන ලද මන්ත්‍රී මණ්ඩලයත් ගරු සභාපතිතුමන් ඇතුළු අදාල අනෙකුත් කාර්යය මණ්ඩලය සහිත ටෙන්ඩර් මණ්ඩලයම මේ සඳහාද සම්බන්ධ කර ගනිමින් විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව මෙම දේපල ටෙන්ඩර් කර බදු දීම සුදුසු බවට ද මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 02**

2022 වර්ෂයේ පෙබරවාරි මාසයට ආයතනය සඳහා මිලදී ගනු ලැබූ පහත සඳහන් අත්‍යවශ්‍ය මිලදී ගැනීම් සඳහාත්, ඉදිරිපත් කර ඇති අනිකුත් යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහාත් මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි

I. කර්මාන්ත අංශය සඳහා කලර් පින්ටර් යන්ත්‍රයක් මිලදී ගැනීම රු. 45,600.00

II. විදුලි අංශය සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම රු.151,000.00

III. මොනරාගල නව බස්නැවතුම්පොළ විවේකාගාර කාමරය සහ වැසිකිළි පද්ධතිය ඉදිකිරීම වෙනුවෙන් සභා අරමුදලින් රු.මිලියන 2 ක මුදලක් ලබා ගැනීම සුදුසු බවට LDSP ව්‍යාපෘතියට අදාල ප්‍රසම්පාදන කමිටුවේදී ගෙන ඇති තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා.

IV. ප්‍රාදේශීස සභාවට අවශ්‍ය ප්‍රමාණවත් ධාරිතාවයෙන් යුතු විදුලි උත්පාදන යන්ත්‍රයක් මිල දී ගැනීම.

එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී ගරු සභාවේ කළ විමසීම් වලට අනුව LDSP ව්‍යාපෘතිය මගින් සිදු කරන ව්‍යාපෘති සඳහා ඔවුන් විසින් මුදල් ලබා දුන්නද මේ වන විට වර්තමානයේ පවතින මිල ගණන් වෙනස් වෙමින් පවතින බැවින් ගරු ආණ්ඩුකාර තුමාත්, පළාත් පාලන කොමසාරිස් තුමාත් උපදෙස් ලබා දී ඇත්තේ මෙසේ වැඩි වන මුදල් සභා අරමුදල් යොදවා සිදු කිරීමට පියවර ගත යුතු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරනලදි.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ආයතනයට අත්‍යාවශ්‍ය ඉහත මිල දී ගැනීම් විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව මිල දී ගෙන සභා අරමුදලින් ගෙවීම් කිරීම සුදුසු බවටත් , LDSP ව්‍යාපෘතියට අදාලව මොනරාගල නව බස්නැවතුම්පොළ විවේකාගාර කාමරය සහ වැසිකිළි පද්ධතිය ඉදිකිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේදී ගෙන ඇති ඉහත තීරණය ලබා දී ඇති උපදෙස් හා කොන්දේසි වලට යටත්ව විධිමත් ක්‍රමවේදයන්ට අනුව ක්‍රියාත්මක කිරීම සුදුසු බවටත්, ඒ වගේම ආයතනයට අවශ්‍ය අදාල ධාරිතාවයෙන් යුක්ත (05 KW ට වැඩි) විදුලි උත්පාදන යන්ත්‍රයක් විධිමත් ක්‍රමවේදයන්ට අනුව සභා අරමුදලින් මිල දී ගැනීම සුදුසු බවටත් සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යොජනා අංක 03**

මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු සභා අරමුදලින් සිදු කිරීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

i. වැලියාය පෙර පාසලේ ඉදිරිපස කොටස කොන්ක්‍රීට් කර වහලය සකස් කර වැඩ නිම කිරීම.

ii. වැලියාය පෙර පාසල වටා දැල් ආවරණය සකස් කර පවතින අත්‍යාවශ්‍ය අලුත්වැඩියා කටයුතු සිදු කර වැඩ අවසන් කිරීම.

iii. වැලියාය සෞඛ්‍ය ( මාතෘ) මධ්‍යස්ථානය ඉදිරිපිට කොටස කොන්ක්‍රීට් කිරීම.

iv. නගරයේ බස් නැවතුම්පොළ භූමියේ පළුදු ස්ථාන ප්‍රිමික්ස් යොදා පිළිසකර කිරීම.

v. නව බස්නැවතුම් පල ගොඩනැගිල්ල පරවියන් ආදී සතුන් විසින් අපිරිසිදු කිරීම හේතුවෙන් එහි වහලය සහ ඒ වටා දැල් ආවරණයක් සකස් කිරීම හා එහි ඉදිරිපස කොන්ක්‍රීට් යොදා සකස් කිරීමත්,බල්බ් සවි කර එහි විදුලි පද්ධතිය අලුත්වැඩියා කිරීම.

vi. පැරණි පොළ භූමියේ නව වෙළෙඳ සංකීර්ණය අසල ඇති බෝධිය වටකර මල් ආසනයක් සකස් කිරීම හා ඒ අසල කාණු පද්ධතිය සුද්ද පවිත්‍ර කර කැඩී බිඳී ගොස් ඇති කොන්ක්‍රීට් ප්ලේට් අලුත්වැඩියා කර සකස් කිරීම.

vii. නව බස්නැවතුම් පොල ගොඩනැගිල්ලේ ඇති පොදු වැසිකිළියේ පවතින අඩුපාඩු සකස් කර තීන්ත ආලේප කර වැඩ අවසන් කිරීම සඳහා.

එම යෝජනාව සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාර්මික නිලධාරී මගින් අදාල නිර්දේශ ලබා ගනිමින් මෙම අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සහා අරමුදලින් නිසි පරිදි සිදු කර එසේ පිළිසකර කරන දෑ සම්බන්ධව පසු විපරම් ද සිදු කරමින් පවත්වාගෙන යාම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 04**

මේ මීට පෙර සභා වාරයකදී අනුමත වුවත් මෙතෙක් සිදු කිරීමට නොහැකි වූ මොණරාගල වැලියාය වසමට අයත් රබර් වත්ත මාර්ගයේ සිට පාලම අසල මාර්ගයේ කොටස දැඩි ලෙස අබලන් තත්ත්වයක පවතින බැවින් මගී අනතුරු බහුලව සිදුවන ස්ථානයක් වන අතර ප්‍රධාන මාර්ගය සඳහා ප්‍රවේශ වීමට ඇති මෙම අතුරු මාර්ගයේ මීටර් 30 ක පමණ කොටස කොන්ක්‍රීට් කර සකස් කර දීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනාව.

එම යෝජනාව සුදුසු බවට පී.බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මීට පෙර ජීවිත හානි 2 ක් පමණ සිදු වී ඇති මෙම අනතුරුදායක ස්ථානය සකස් කිරීම ඉතා වැදගත් යෝජනාවක් වන අතර කාර්මික නිලධාරී මහතා යොදවා පරීක්ෂා කර බලා මෙම මාර්ගයේ අනතුරුදායක මෙම කොටස සුදුසු ආකාරයකට විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සහා අරමුදලින් සකස් කර දීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**05.2 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සනත් ගුණවර්ධන මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනාව.**

මොණරාගල පස්වන පටුමග සිරිගල මාර්ගයේ සණස ගොඩනැගිල්ල දක්වා දිවෙන මාර්ගය සභා අරමුදලින් අලුත්වැඩියා කටයුතු කර ප්‍රතිසංස්කරණය කර දීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට සනත් ගුණවර්ධන ගරු මන්ත්‍රී තුමන් විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනාව.

එම යෝජනාව සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

සභා අරමුදලේ ප්‍රමාණවත් මුදල් පවතින අවස්ථාවන්වලදී විධිමත් ක්‍රමවේදයන්ට අනුව මෙම මාර්ගයේ අදාල සංවර්ධන කටයුතු ප්‍රදේශයේ මහජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් සිදු කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**05.3 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී මන්ත්‍රී පී.බණ්ඩාර මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා**

මොනරාගල දෙබැද්දෙකිවුල ග්‍රාම නිලධාරී වසමේ මොරලන්ද අතුරු මාර්ගය සභා අරමුදලින් කොන්ක්‍රීට් කර සංවර්ධනය කර දීම සඳහා මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට පී.බණ්ඩාර ගරු මන්ත්‍රී තුමන් විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනාව.

එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

සභා අරමුදලේ ප්‍රමාණවත් මුදල් පවතින අවස්ථාවන්වලදී විධිමත් ක්‍රමවේදයන්ට අනුව මෙම මාර්ගයේ අදාල සංවර්ධන කටයුතු ප්‍රදේශයේ මහජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් සිදු කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

➢ **කල් දී නොමැති හදිසි යෝජනා ඉදිරිපත් කිරීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර අනුමැතිය ගත යුතු කල් දී නොමැති හදිසි යෝජනා 03 ක් සම්බන්ධයෙන් මහ සභා අනුමැතිය ලබා ගත යුතු බවට ගරු සභාපතිතුමා සභාවෙන් විමසීම් කළ අතර, එම යෝජනා ඉදිරිපත් කිරීම සඳහා මහ සභාවේ විරුද්ධත්වයක් නොමැතිව එකඟතාවය එල කර සිටි බැවින් ගරු සභාපතිතුමා විසින් එම හදිසි යෝජනා පහතින් දක්වා ඇති ආකාරයට සභාගත කරන ලදි.

I. මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් 252 – 6330 අංක දරන කැබ් රථයේ අත්‍යාවශ්‍ය අලුත් වැඩියා කටයුතු කිහිපයක් වෙනුවෙන් අනුමැතිය ඉල්ලා මීට පෙර එනම් 2022.03.09 දිනැති ලිපිය මගින් පළාත් පාලන කොමසාරිස් (ඌව) වෙත ඉල්ලීම් කර ලිපියක් යවන ලද අතර නැවත ඒ සඳහා මහ සභා අනුමැතියක් ගෙන එහි තීරණය එවන ලෙස අද දින දුරකථනයෙන් දැනුම් දී ඇති අතර මේ සඳහා ආයතන තුනකින් මිල ගණන් ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව රු.160,810.00 ක අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නව ඩිපෝව පාර, හුලංදාව,මොනරාගල හී චාමර මෝටර්ස් ආයතනයෙන් මෙම හදිසි අලුත්වැඩියා කටයුතු සිදු කර ගැනීම සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම කැබ් රථයේ අදාල අලුත්වැඩියා කටයුතු වලට අදාලව කර ඇති පරීක්ෂා කටයුතු සහ නිර්දේශ වාර්තාවන්ට අනුව සහ මිල කමිටු තීරණයන්ට යටත්ව අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අදාල ආයතනයෙන් විධිමත් ක්‍රමවේදයන්ට හා අනුමැතීන්ට යටත්ව මෙම අත්‍යාවශ්‍ය අලුත් වැඩියා කටයුතු සිදු කර සහ අරමුදලින් ගෙවීම් කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

II. ලංකා විදුලිබල මණ්ඩලය මගින් මැදගම සිට අම්පාර දක්වා 132 kv සම්ප්‍රේෂණ මාර්ගය ප්‍රතිස්ථාපනය කිරීමේ ජාතික වැදගත් කමකින් යුක්ත රජයේ මැදිහත්වීමෙන් සිදු කරනු ලබන ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු කර ගෙන යන අතර මෙයට අදාලව අවශ්‍ය අමුද්‍රව්‍ය ගබඩා කර ගැනීමට මොනරාගල බල ප්‍රදේශය තුළ නගරයට ආසන්න ස්ථානයක් අවශ්‍ය බැවින් ඒ සඳහා අක්කර 1 – 2 ක පමණ භූමි ප්‍රමාණයක් අවුරුදු 2 කට ආසන්න කාලයකට අවශ්‍ය වී ඇති බැවින් මෙම සංවර්ධන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා සහනදායී ක්‍රම වේදයකට අනුව මේ සඳහා අවශ්‍ය භූමියක් ලබා දෙන ලෙස මෙම සම්ප්‍රේෂණ මාර්ග තැනීමේ ව්‍යාපෘති භාර සිවිල් ඉංජිනේරු එම්.පී.පලිහවඩන මහතා විසින් අද දින අප වෙතින් ඉල්ලීමක් කර ඇති බැවින් මේ සඳහා අද දිනම මහ සභාවේදී සාකච්ඡා කර තීරණයක් ගත යුතු බැවින් මහා සභාවේ අනුමැතිය මේ සඳහා ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

මෙම ව්‍යාපෘතියේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා අප විසින් මෙම ඉල්ලීම සලකා බලා හැකි අයුරින් අවශ්‍ය සහයෝගය ලබා දිය යුතු බැවින් මේ සඳහා සභාවට අයත් දැනට භාවිතයට නොගන්නා භූමියකින් යම් භූමි ප්‍රමාණයක් කොන්දේසි සහිතව මෙම ව්‍යාපෘතියේ වැඩ නිම වන තෙක් ලබා දීම සුදුසු බවට සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර මේ සඳහා බඩු පටවන ලද බර වාහන වැඩි වශයෙන් භාවිතයට ගන්නා බැවින් එමගින් හානියක් නොවන පරිදි සුදුසු භූමියක් ලබා දීමට කටයුතු කළ යුතු බවට සභාවේ වැඩි දුරටත් සාකච්ඡා විය.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

හුලංදාව බිබිල මාර්ගයේ දිස්ත්‍රික් ලේකම් කාරයාලය අසල ඇති ප්‍රාදේශීය සභවට අයත් ශරීරසුවතා උද්‍යානය පිහිටි භූමියේ පිටුපස කොටසින් අක්කර 1යි ½ ක් මෙම ව්‍යාපෘතියේ කටයුතු සඳහා ලබා දීම සුදුසු බවත් ඒ වගේම කොන්දේසි සහිතව විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව ඔවුන්ගේ ඉල්ලීම පරිදි වර්ෂ 02 ක් සඳහා ලබා දීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි. එසේම රජයේ දායකත්වයෙන් සිදු කරනු ලබන මෙම ව්‍යාපෘතිය සඳහා ලබා දෙනු ලබන අදාල භූමි පරිශ්‍රය සඳහා මීට අදාල මාසික කුලිය වශයෙන් රු.20000.00 (විසිදහසක) මුදලක් සභාව මගින් මාසිකව අය කිරීම සුදුසු බව ද සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

III. ඒ වගේම අද දින සභාවට පැමිණි සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමන් විසින් ඉදිරිපත් කර ඇති කුඹුක්කන ග්‍රාම නිලධාරී වසමේ සිල්බර පාර හී අතුරු මාර්ගයක ජීවත් වන පවුල් 10 ක පමණ ජනතාව තම ගමන් බිමන් අවශ්‍යතාවයන් සඳහා එම මාර්ගයේ පවතින ආරක් මතින් යොදවා තිබූ ඒදණ්ඩක් භාවිත කර ඇති අතර පසු ගිය දිනයේදී මෙම ඒ දණ්ඩ හදිසියේම කඩා වැටීම මත මෙම ජනතාවගේ ගමන් බිමන් සඳහා දැඩි බලපෑමක් ගෙන දී ඇති බැවින් මෙම ස්ථානයට ඉතා කඩිනමින් සහා අර මුදල් මගින් බෝක්කුවක් සකස් කර දීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාර්මික නිලධාරී මහතා යෝදවා මෙම ස්ථානය පරීක්ෂා කර බලා නිර්දේෂ වාර්තාවන් ලබා ගැනීමෙන් අනතුරුව අපහසුතාවට පත්ව ඇති මෙම ජනතාවට හැකි අයුරින් විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සහා අරමුදලින් බොක්කුවක් සකස් කර දීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

## 06. <u>ආදායම් වියදම් වාර්තාව සහා සම්මත කිරීම</u>

න්‍යායපත්‍රානුකූලව පසුගිය මාසයට අදාළව ඉදිරිපත් කර ඇති ආදායම් වියදම් වාර්තාව සහා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

පසුගිය මාසයේ එනම් 2022.02.01 දින සිට 2022.02.28 දින දක්වා වන ආදායම් වියදම් වාර්තාව චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමන්ගේ සහ රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාවේ විරෝධතාවයන් ද නොමැති වූ බැවින් පිළි ගැනීම සුදුසු බවට ගරු සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 07. <u>කමිටු වාර්තා සලකා බැලීම</u>

ඉදිරිපත් වී නොමැත

## 08. <u>වෙනත් කරුණු ඉදිරිපත් කිරීම</u>

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ වෙනත් කරුණු ඉදිරිපත් කිරීම බැවින්,වෙනත් කරුණු සමඟම සභිකවරුන්ට අදහස් ප්‍රකාශ කිරීමට ඇත්නම් ඒ වෙනුවෙන් ගරු සභාවට අවසර ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදි.

### 08.1 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - උදේනි රම්‍යලතා මැතිතුමිය</u>

අවසර ගැනීමෙන් අනතුරුව මුළු මහත් රටේ සියලු මහජනතාව දුකට පීඩාවට පත්ව ඉතා කණගාටුදායක තත්වයකට මුහුණ දී ඇති අතර මේ දේවල් කතා නොකර ම සිටිය නොහැකි අතර ඉන්ධන ප්‍රශ්න,ගෑස් ප්‍රශ්න, ඖෂධ හිඟකම, දිනෙන් දින සීඝ්‍ර ලෙස ඉහළ යන බඩු මිල ආදිය ජනතාවට මෙන්ම අප කාටවත්ම දැරිය නොහැකි තත්ත්වයකට පත්ව ඇති අතර මේ දුක කියාගත නොහැකිව දුක අහන්න කෙනෙක් නොමැතිව කන්න බොන්න හරියට නොමැතිව ඇඬූ කඳුළින් ජනතාව අද ජීවත්වන වන අතර මේ සඳහා වගකිව යුත්තේ කවුද යන්නත්, මේ කාගේ අපලයක් ද යන්නත් ,මේ කණගාටුදායක තත්ත්වයෙන් රටේ ජනතාව මුදවා ගන්නේ කෙසේද යන්නත් ගරු මන්ත්‍රීතුමිය ප්‍රකාශ කර සිටින ලදි.

ඒ වගේම ජනතාවට මුහුණ දිය නොහැකි තත්වයක් රට තුළ උද්ගතව ඇති අතර මේ දේවල් වලට නිශ්ශබ්දව බලා සිටිනවාට වඩා රජය මගින් කඩිනම් විසඳුම් මේවාට ලබා දිය යුතු අතර ප්‍රාදේශීය සභාවක මහජන නියෝජිතයින් වශයෙන් අපිට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙවැනි මොහොතක ජනතාව පත්ව ඇති මේ අඳුරු අගාධයෙන් එළියට ගැනීමට හැකි සෑම පියවරක්ම ගත යුතු අතර, ඒ ඕනෑම තීන්දු තීරණයකට තම පක්ෂයේ සියළුදෙනාම උපරිම සහයෝගය ලබාදෙන බවත් ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමිය සියලු දෙනාටම ස්තූතිය පුද කර සිටින ලදි.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

මේ මොහොතේ රට තුළ ප්‍රශ්න ඇති වී තිබෙන බවත් මේ බොහෝ ප්‍රශ්න වලට කොරෝනා උවදුර මූලිකවම බලපාන බව අප කවුරුත් පිළිගත යුතු කරුණක් වන අතර පසුගිය යහපාලන ආණ්ඩුව සමයේ වරාය අවුරුදු දෙසීයකට විකිණීමත් , නෙළුම් කුළුනේ උස අඩු කිරීමත් රටේ තිබූ ඩොලර් අවම වී යන ආකාරයට කටයුතු කිරීමත් ආදී කරුණු බොහෝ ප්‍රශ්නවලට ප්‍රතිවිපාක වශයෙන් වර්තමානයේ බලපා ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

### 08.2 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - රමණී රත්නායක මැතිතුමිය</u>

අවසර ගැනීමෙන් අනතුරුව පසුගිය මාර්තු 8 වන දින පැවති කාන්තා දිනයේ දී පැවති සාකච්ඡාවන් වලදී සමාජයේ විශේෂ තැනක් හිමි විය යුතු කාන්තාව අද වන විට රටේ පවතින තත්වය සමග ඉතාමත් දුක් කම්කටුලු රාශියක් මැද ජීවත් වීමට සිදුව ඇති බවත්, කිරිපිටි පෝලිම්, ගෑස් පෝලිම්,

ඉන්ධන පෝලිම් වල අද සියලුම ජනතාවට රැඳී සිටීමට සිදුවී ඇති අතර ප්‍රාදේශීය සභාවක් වශයෙන් අපට කළ හැකි දෙයක් නොවුණ ද රජය මගින් මේවට වහාම විසඳුම් ගැනීමට කටයුතු කළ යුතු බව ගරු මන්ත්‍රීතුමිය සඳහන් කර සිටින ලදි.

ඒ වගේම පවතින තත්ත්වයත් සමඟ වෙළෙඳ පොළේ භාණ්ඩ වල කිසිම පාලන මිලක් නොමැති වීම මත ද ජනතාව මහත් පීඩාවකට පත්ව ඇති අතර එකම භාණ්ඩය වෙළඳසැල් කිහිපයක වෙනස් වෙනස් මිල ගණන් යටතේ විකිණීම සම්බන්ධයෙන් පාරිභෝගික අමාත්‍යාංශයක් මේ රටේ පවතිනවාද යන්න ප්‍රශ්ණයක් බවත් රට තුළ ඇති ප්‍රශ්න හමුවේ භාණ්ඩ වල පාලන මිලක් නොමැති කමින් ජනතාව තව තවත් අසරණ කිරීම ඉතාමත් කණගාටුදායක තත්ත්වයක් බව ගරු මන්ත්‍රීතුමිය සඳහන් කර සිටින ලදි.

ඒ වගේම ගරු සභාපතිතුමා ප්‍රමුඛ ප්‍රාදේශීය සභාවේ සියලුම දෙනා ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් වගකීම් හා යුතුකම් නොපිරිහෙලා ඉටුකරන අතර ජනතාව වෙනුවෙන් ගන්නා නිවැරදි තීන්දු තීරණ වලට අප සියලු දෙනාම සහයෝගය ලබාදෙන බවත් ඒ වගේම රට තුළ නිර්මාණය වී ඇති මේ අයහපත් තත්වයත්, කොරෝනා වසංගතයත් ඉක්මනින්ම තුරන් වී ජනතාවට සෞභාග්‍යය උදා වේවා කියා ප්‍රාර්ථනා කරමින් ගරු මන්ත්‍රීතුමිය සියලු දෙනාටම ස්තූතිය පුද කර සිටින ලදි.

**ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම**

මොණරාගල නගරයේ දැනට ප්‍රධාන තොග බඩු අලෙවි කරන වෙළෙඳ ආයතන පවතින්නේ ඉතාමත් සීමිත ප්‍රමාණයක් බැවින් මේ තත්ත්වය වෙනස් කළ යුතු අතර කෙසේ වෙතත් නගරයේ කඩ පේළියක් සකස් කිරීමට කටයුතු කරගෙන යන අතර එය නිම වීමෙන් පසුව විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව ටෙන්ඩර් කර බදු දීමට පියවර ගන්නා අතර එම කඩ කාමර තොග කඩ වශයෙන් පමණක් පවත්වාගෙන යාම සඳහා ලබාදෙන බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

ඒ වගේම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දී බල ප්‍රදේශයට අයත් අවශ්‍ය සියලුම කරුණු කාරණා සම්බන්ධයෙන් තමන්ට සාකච්ඡාවට බඳුන් කරන බවත් පසු ගිය දින පැවති එම රැස්වීමේදී ද මොණරාගලින් හැදී වැඩී ස්වයංපෝෂිත වන කිරි ගවයින්ගේ කිරිවලින් නිෂ්පාදන කරනු ලබන සියලුම පැල්වත්ත කිරි ආශ්‍රිත නිෂ්පාදන කොළඹ ප්‍රදේශයට ගෙන යන අතර අපේ ප්‍රදේශයේ වෙළඳසැල් වලට මේවායින් බොහෝම සීමිත ප්‍රමාණයක් නිකුත් කිරීම මත ඒවා පාරිභෝගික ජනතාවගේ අවශ්‍යතාවයට ප්‍රමාණවත් නොවන බැවින් වෙළඳසැල් හිමියන්ද ඇතුලුව ජනතාව මහත් අපහසු තත්ත්වයකට මුහුණ දී ඇති බැවින් මේ සම්බන්ධයෙන් තමන් එහිදී සාකච්ඡා කළ අතර ඒ මොහොතේදී ම ප්‍රධාන අමාත්‍යතුමන් විසින් මේ සම්බන්ධව සොයා බලා එසේ නොවීමට කටයුතු කරන ලෙසට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දුන් බවත් ගරු සභාපතිතුමන් සඳහන් කර සිටින ලදි.

## 08.3 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.බණ්ඩාර මැතිතුමා

වර්ථමාණය වන විට රට තුළ නිර්මාණය වී ඇති දැවැන්ත ගැටලුකාරී තත්ත්වය සම්බන්ධව කතා නොකර ම බැරි තැනට අද පත්ව ඇති අතර මෙය මහජනතාවට මෙන්ම මහජන නියෝජිතයින් වන අප සියලුම දෙනාටත් බලපා ඇති දැවැන්ත ප්‍රශ්නයක් වන අතර මේ සම්බන්ධයෙන් විශ්ලේෂණයන් සිදු කරන ආර්ථික විද්‍යාඥ විශ්ලේෂකයින් විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් දීර්ඝකාලීන විශාල ණය මුදලක් ලබා ගැනීමට කටයුතු කිරීම මේ සඳහා වන එකම විසඳුම වශයෙන් පෙන්වා දී ඇති අතර විශේෂයෙන්ම මේ වන විට රට තුළ ගොඩනැගී ඇති වාතාවරණයත් සමඟ ආණ්ඩුව විසින් ගන්නා තීන්දු තීරණ මේ වන විට වන ජනතාව විසින් විශ්වාස නොකරන තැනට පත්ව ඇති අතර මෙය

ආණ්ඩුව විවේචනය කිරීමක් නොවන අතර රටේ පවතින මෙම ආර්ථික පසුබෑම තුළින් ගොඩ ඒමට ජාත්‍යන්තර වශයෙන් මෙවැනි දීර්ඝකාලීන විශාල ණය මුදලකට යාම රට තුළ නිර්මාණය වී ඇති මේ සියලුම ප්‍රශ්නවලට විසඳුම් ලබාගත හැකි බවට ගරු මන්ත්‍රී තුමා ප්‍රකාශ කර සිටින ලදි.

විශේෂයෙන්ම දේශපාලනයෙන් තොරව අපි සියලු දෙනාම රටේ පුරවැසියන් බව සිතා මේ මොහොතේ කටයුතු කළ යුතු බැවින් අපි සියලු දෙනාම එකතු වී අපේ මහ ජනතාවට ඉටු විය යුතු යුතුකම් හා වගකීම් නොපිරිහෙලා ඉටු කිරීමට වගකීමෙන් යුතුව කටයුතු කරමු බව සඳහන් කරමින් ගරු මන්ත්‍රිතුමා සියලු දෙනාටම ස්තුතිය පුද කර සිටින ලදි

**<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ණය ලබාගත හැකි හැකි වීම මෙයට විසඳුමක් වුවත් ඔවුන් විසින් පනවන සියලුම කොන්දේසි වලට යටත් විය යුතු අතර පුළුවන් තරම් කොන්දේසි වලට යටත් නොවී මෙම ප්‍රශ්න විසඳා ගැනීමට රජය විසින් උත්සාහ ගන්නවා විය හැකි බැවින් එසේ නොවුණහොත් යම් කිසි ආකාරයෙන් මේවාට විසඳුම් ගැනීමට කටයුතු කරයි යන්නත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

**<u>ගරු සභාපතිතුමා</u>**

- අනතුරුව සභිකවරුන්ගේ වෙනත් කරුණු ඉදිරිපත් නොවූ බැවින්, ලබන මස සභා රැස්වීම 2022 වර්ෂයේ අප්‍රේල් මස 08 වන සිකුරාදා දින ප.ව.2.30 ට යොදා ගැනීම සුදුසු බවට සභාවේ සියළු දෙනාගේම එකඟතාවය මත තීරණය කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් අද දින මාසික මහ සභාව සාර්ථක කර ගැනීමට පැමිණි ගරු උප සභාපතිතුමන් ඇතුළුව සියලුම මන්ත්‍රිවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටි සියලුම දෙනාට ස්තූතිය පුද කරමින් ගරු සභාපතිතුමා විසින් මහ සභාවේ වැඩ කටයුතු ප.ව.5.00 ට පමණ අවසන් කරන ලදී.

- 2022.03.11 දින මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

සභා වාර්තාව .................................................................................. වන දින පැවැති මහ සභාවේ.........................................................................................................යෝජනාවෙන් සහ.............................................................................................................ස්ථිරත්වයෙන්

ඒකමතිකව/ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

| | | | |
|---|---|---|---|
| ල් හා ප්‍රතිපත්ති කසීම් කමිටුව | තාක්ෂණික සේවා කමිටුව | නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව | පරිසර හා පහසුකම් කමිටුව |

මෙම සභා වාර්තාව ........................................................................... වන දින පැවැති මහ සභාවේ.......................................................................................................යෝජනාවෙන් සහ............................................................................................................ස්ථිරත්වයෙන් ඒකමතිකව/ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

1) මොනරාගල, මාගන්දනමුල්ල හි පිහිටි පරාක්‍රම මාවත ලිපිනයෙහි පදිංචි පවුල් 07 ක් පමණ භාවිතා කරන ඉතා අබලන්ව පැවති මාර්ගය ඊයේ දින ඇතිවූ අධික වර්ෂාව හේතුවෙන් ගමන් කිරිමටවත් නොහැකි ලෙස දැඩි සෝදා පාළුවකට පත්ව ඇති බැවින් එම මාර්ගය කුට්ටි ගල් අතුරා ඉතා කඩිනමින් පිළිසකර කර දීම අත්‍යාවශ්‍ය බැවින්, ඒ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සනත් ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

පවුල් 07 ක පමණ ජීවත් වන ජනතාවක් මෙම මාර්ගය භාවිත කරන බැවින් කාර්මික නිලධාරි නිලධාරි මහතා යොදවා පරීක්ෂා කර බලා කුට්ටි ගල් අතුරා භාවිතා කළ හැකි පරිදි ඉතා කඩිනමින් සකස් කර දීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

2) කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරිම සඳහා යන වියදම සලකා බලා දැනට කිලෝ ග්‍රෑම් 01 ක විකුණුම් මිල වන රු.15.00, රු.20.00 දක්වා ඉහළ නැංවීමටත්, තව ද එක් ගොවියෙකු සඳහා නිකුත් කළ හැකි උපරිම කිලෝ ප්‍රමාණය තීරණය කිරිම සඳහාත් ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම කුඹුරු ඉඩම් හිමිකරුවන්ගේ ඉල්ලීම් පරිදි ඔවුන් එම ඉඩම් සඳහා අදාළ අක්කර බදු ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවට ගෙවන්නේ නම් එම කුඹුරු ඉඩම් සඳහා ප්‍රාදේශීය සභාවේ ලේඛනවල සටහන් කර ඇති වරිපනම් බදු පිළිබඳ තොරතුරු සහ අදාළ බිල් කිරීම් නතර කිරිමටත්, එම දේපල සඳහා මෙතෙක් පවතින රු.407,841.68 ක අය කර ගැනීමට නොහැකි හිඟ මුදල ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියට යටත්ව ලේඛනවලින් කපා ඉවත් කිරිම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

➢ **ගරු සභාපතිතුමන් විසින් හදිසි යෝජනා ඉදිරිපත් කර සිටීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදි කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර අනුමැතියක් ගත යුතු හදිසි යෝජනා 01 ක් සම්බන්ධයෙන් මහ සභා අනුමැතිය ලබා ගත යුතු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ අතර ඒ සඳහා මහ සභාවේ විරුද්ධත්වයක්ද නොතිබුණු බැවින් ගරු සභාපතිතුමා විසින් එම හදිසි යෝජනා පහතින් දක්වා ඇති ආකාරයට සභාගත කරන ලදී.

a) 2021 වර්ෂයට සභාව සතු සතිපොළ බදු ගත් බදුකරු විසින් ආරම්භක මාසයේ සිට ම රටේ පවතින කොරෝනා වසංගතය හේතුවෙන් සතිපොළ පැවැත්වීම අඩාල වී ඇති අතර, පළමු සතිය තුළ සතිපොළ වසා තබන ලද අතර, දෙවන සතියේ සිට නැවත පොළ විවෘත කළ ද ගොවියන් නිෂ්පාදන රැගෙන ඒම වෙළඳුන්ගේ ප්‍රමාණය සහ සමස්ථ පාරිභෝගිකයන්ගේ පැමිණීම 50%කටත් වඩා අඩු බවත්, නගරයට පැමිණීමට බොහෝ දෙනෙක් අකැමත්තක් දක්වන බැවින් ගොවීන් තම නිෂ්පාදන තම නිවෙස් වෙතින් ම තොග වෙළඳුන්ට විකිණීමේ ක්‍රමවේදයක් ද පවතින නිසා ගිවිසුම්ගත මුදලට සතිපොළ බදු අය කර ගෙන යාම ඉතාමත් අපහසු බැවින්, ගිවිසුම් ප්‍රකාරව මාසිකව සභාවට ගෙවනු ලබන වාරික මුදලින් 50% ක සහන මුදලක් අඩු කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බැවින්, මේ සඳහා මහ සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයසීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම ඉල්ලීමේ යම් සාධාරණත්වයක් පැවතිය ද මේ මොහොතේ මෙම ඉල්ලීම සඳහා මාසික වාරිකයෙන් 50% අඩු කිරීම සම්බන්ධව තීරණයක් ලබා දිය නොහැකි බවත්, ලබන සතියේ ද සතිපොළ පැවැත්වීම හා වෙළඳුන්ගේ පාරිභෝගිකයින්ගේ පැමිණීම සම්බන්ධව සොයා බලා ආදායම් පරීක්ෂක මගින් සම්පූර්ණ වාර්තාවක් ලබා ගැනීම සිදු කළ යුතු බවටත්, ඒ අනුව ඉදිරියේදී තීරණයක් ගැනීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී. සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**අවසන් පිටුවට**

සභිකවරුන්ගේ වෙනත් කරුණු තවදුරටත් ඉදිරිපත් නොවූ බැවින්, ගරු සභාපතිතුමා විසින් අද දින මාසික මහ සභාව සාර්ථක කර ගැනීමට පැමිණි සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටි සියලුම දෙනාට ස්තුතිය පුද කරමින් ගරු සභාපතිතුමා විසින් මහ සභාවේ වැඩ කටයුතු ප.ව.6.30 ට පමණ අවසන් කරන ලදී.

- 2021.08.24 දින මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,

- **හදිසි යෝජනා ඉදිරිපත් කිරීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර තීරණ ගත යුතු හදිසි යෝජනා කිහිපයක් සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු බවට ගරු සභාපතිතුමා මහ සභාව වෙත ප්‍රකාශ කර ඒ සඳහා සභාවේ එකඟතාවය විමසා සිටින ලදි.

තවද න්‍යාය පත්‍රය සකස් කිරීමෙන් අනතුරුව අප වෙත ලැබුණු දැනුම් දීමකට අනුව මෙම ව්‍යාපෘතියට අදාල සංවර්ධන කටයුතු 2021 නොවැම්බර් මස 30 වන විට අවසන් කර බිල් පත් ඉදිරිපත් කළ යුතු බව දන්වා ඇති බැවින් මෙය හදිසි යෝජනාවක් ලෙස සභා අනුමැතියට ඉදිරිපත් කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඒ සඳහා මහ සභාවේ සියලු දෙනාගේ එකඟතාවය ලබා දීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පහත යෝජනව ද මහ සභාවට ඉදිරිපත් කරන ලදි.

I. තවද මාර්ග අමාත්‍යාංශය මගින් මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මිලියන 52ක් වෙන් කර ඇති අතර එම ප්‍රතිපාදන මගින් මාර්ග 49ක් සංවර්ධනය කළ යුතුව ඇත.මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මෙන්ම මඩුල්ල, සියඹලාණ්ඩුව, බුත්තල යන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල ද මෙම සංවර්ධන වැඩසටහන යටතේ මාර්ග සංවර්ධනය කිරීමේදි රෙඩි මික්ස් කොන්ක්‍රීට් යෙදිය යුතු බවට දන්වා ඇති අතර මෙම බල ප්‍රදේශ 4ටම රෙඩි මික්ස් සපයන ආයතන ඇත්තේ දෙකක් පමණක් බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටි අතර මෙම ආයතන දෙක මගින් මෙම මාර්ග සියල්ලටම රෙඩි මික්ස් සැපයීය යුතු අතර 2021 නොවැම්බර් මසට 30 දිනට පෙර අදාල මාර්ග වල ඉදිකිරීම් අවසන් කර මාර්ග අමාත්‍යාංශය වෙත බිල් පත් ඉදිරිලත් කළ යුතුව ඇත. එබැවින් මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවලට අයත් සංවර්ධනය කෙරෙන මාර්ග වැඩි ප්‍රමාණයක් පටු බව සහ බෑවුම් සහිත වීම නිසා රෙඩිමික්ස් ප්‍රවාහනයට අපහසු තත්ත්වයක් පවතින අතර කුඩා කොන්ක්‍රීට් මික්චර් යන්ත්‍රය යොදවාගෙන මෙම මාර්ග කොන්ක්‍රීට් කිරීමට සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මාර්ග අමාත්‍යාංශයෙන් දැනුම් දී ඇති පරිදි අදාල උපදේ හා කොන්දේසි වලට යටත්ව විධිමත් ක්‍රමවේදයන්ට අනුව මෙම ව්‍යාපෘතිවල කටයුතු අදාල දිනට පෙර සිදු කිරීම සුදුසු බවටත්, කුඩා කොන්ක්‍රීට් මික්චර් යන්ත්‍ර යොදවාගනිමින් මෙම මාර්ග කොන්ක්‍රීට් කිරීමට පියවර ගැනීම සුදුසු බවටත් සභාව ඒකමතිකව අනුමත කරන ලදී.